සැ. යු. - මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,713 - 2011 ජූලි මස 01 වැනි සිකුරාදා - 2011.07.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 956 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජූලි මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජූනි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


987 - B 80238 — 7,125 (2011/07)
F 1 – (S/E)

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ලත් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් කාණ්ඩය හා වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් | වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| (I) | III පන්තියේ නුපුහුණු කම්කරු මාර්ග/සායන/ ආදාහනාගාර/ සෞඛ්‍ය කම්කරු) | 07 | 6/2006(IV)<br>PL 1-2006 (A)<br>රු. 11,730-10x120-10x130<br>10x145 - 12 x 160 -රු. 17,600 | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය සමත්ව තිබීම. මාර්ග කම්කරු 6 ශ්‍රේණිය සමත් විය යුතුයි. සෞඛ්‍ය කම්කරුවන් සඳහා අධ්‍යාපන සුදුසුකම් බලනු නොලැබේ. | |
| (II) | රියදුරු II (“ආ”) | 03 | PL-3(06/2006IV)<br>රු. 12,470-10x130-10x145<br>10x160- 12 x 170 -රු. 18,860 | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණියනමය වසර සමත් වී තිබිය යුතුයි. | 1.තාර බර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව හෝ ඊට වැඩි බර පන්තියක මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද සහතිකයක් ලබා තිබීම.<br><br>2.වාහන රියදුරු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. (සහතික මගින් සනාථ කළ යුතුයි) අවම උස අඩි 05ක් විය යුතුය.<br><br>3. දිවා රාත්‍රී සේවයේ යොදන බැවින් ශාරීරික වශයෙන් සුදුසු විය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුයි.<br><br>4. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ දැනුමක් තිබිය යුතුයි. |

(III) වයස් සීමාව : 2011.07.29 වැනි දිනට වයස අවුරුදු 18 සිට 45 අතර විය යුතුයි. (රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

2. පොදු සුදුසුකම් :-

(iv) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.
(v) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුයි.
(vi) අයදුම්පත් කැඳවන දිනට පෙරාතුව බස්නාහිර පළාත තුළ අවම වශයෙන් වසර 03ක ස්ථිර පදිංචියක් තිබිය යුතු ය.
(vii) ශ්‍රී ජයවර්ධනපුර සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

3. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

*(අ)* මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන්නන් වැන්දඹු හෝ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුයි.
*(ආ)* නව බඳවා ගැනීම් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

*4. සේවා කොන්දේසි :-*

පත්වීම් ලබන්නන් ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලට ද, පළාත් පාලන ආයතනයට අදාළ ආඥාපනත්/අණපනත්වලට විධිවිධානවලට ද, පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝගවලට ද, අනුකූලව කටයුතු කළ යුතුයි.

ඉහත සුදුසුකම් සකස් කර එවන ලද අයදුම්පත් සපුරාලන අයදුම්කරුවන් විසින් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව 2011.07.29 වැනි දිනට හෝ පෙර ලැබෙන සේ "නාගරික කොමසාරිස්, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව, රාජගිරිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. තව ද අයදුම්කරන තනතුර අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ප්‍රමාද වී එවනු ලබන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් සම්බන්ධව සලකා බලනු නොලැබේ.

ශාන්තා පී. ලියනගේ,
නාගරික කොමසාරිස් *(වැ.බ.)*,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

2011 ජූනි මස 17 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව,
රාජගිරිය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ ....................................... තනතුර සඳහා ආදර්ශ අයදුම්පත්‍රය*

1. මුලකුරු සමග නම :————————,
   මුලකුරු වලින් හැඳින්වෙන නම් :————————,
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————,
3. ස්ථිර ලිපිනය :————————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :————————,
5. ස්ත්‍රී/පුරුෂ භාවය :————————.
6. උපන් දිනය : අවුරුද්ද :————————, මාසය :————————, දිනය :————————.
7. වයස : අවුරුදු :————————.
   ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන් ද? :————————.
8. අධ්‍යාපන සුදුසුකම් :————————,
9. රියදුරු බලපත්‍රයේ වර්ගය සහ අංකය (රියදුරු තනතුරු සඳහා අදාළ වේ.) :————————,
10. අයදුම්කරුගේ උස :————————.
11. වෘත්තීය සුදුසුකම් : (i) :————————. (ii) :————————.
12. සේවා පළපුරුද්ද :————————.
13. ඔබ කවරදාක හෝ උසාවි චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද ?

ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

07-131

---

## වත්තල - මාබෝල නගර සභාව

වත්තල - මාබෝල නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති සෞඛ්‍ය කම්කරු තනතුර පිරවීම සඳහා අවම සුදුසුකම් ඇති වත්තල - මාබෝල නගරසභා සීමාව තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| සෞඛ්‍ය කම්කරු | රු.11,730x10x120-10,430-10x145-12x160-රු.17,600 | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |

*වෙනත් සුදුසුකම් :*

01. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.
02. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් ද විය යුතු ය.
03. විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
04. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබුවකු නොවිය යුතු ය.
05. රජයේ/පළාත් රාජ්‍ය සේවයේ/පළාත් පාලන සේවයේ /සංස්ථා සේවයේ පහකරනු ලැබුවකු නොවිය යුතු යි.
06. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබුවෙකු නොවිය යුතු ය.
07. වත්තල - මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ අවම වශයෙන් වසර තුනක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතු ය.

*බඳවා ගැනීමේ කොන්දේසි :*

ආයතන සංග්‍රහය - මුදල් රෙගුලාසි - බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන නියෝගවලට ද, අදාළ පළාත් පාලන ආයතනයේ ආයතන ප්‍රධානීන්ගේ නියෝගවලටද අනුකූලව කටයුතු කළ යුතු ය.

01. අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කරන ලද සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුවේ.

02. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව අයදුම්පත් පිළියෙල කර "ලේකම්, වත්තල - මාබෝල නගර සභාව, වත්තල" යන ලිපිනයට 2011 ජූලි මස 15 වැනි දින ප. ව. 3.00 ට පෙර ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු ය.

03. අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය.

(i) උප්පැන්න සහතිකය,
(ii) පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් ලබාගත් සහතිකය,
(iii) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්, (මින් එක් සහතිකයක් ග්‍රාම සේවා නිලධාරීතැනගේ විය යුතු ය.)
(iv) පළපුරුද්ද පිළිබඳ සහතිකය

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.
2. පත්වීම අවුරුදු 3ක පරිවාස කාලයකට යටත්ය.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුරදී හෝ බඳවා ගැනීම් ප්‍රමාද කිරීම් හෝ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියළු බලතල වත්තල-මාබෝල නගර සභාවේ ලේකම්වරයා සතු වන්නේ ය.

ජී. ඒ. සුනිල් ශාන්ත,
ලේකම්,
වත්තල-මාබෝල නගර සභාව.

2011 ජුනි මස 13 වැනි දින,
වත්තල-මාබෝල නගර සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*............................................ තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ මුලකුරු සමග නම :————————.
   මුලකුරු වලින් හැඳින්වෙන නම් :————————.
2. තැපැල් ලිපිනය :————————.
3. උපන් දිනය: වර්ෂය:————————. මාසය:————————. දිනය:————————.
4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවු :————————.මාස:————————. දින:————————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය:————————.
6. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද:————————.
7. අධ්‍යාපන සුදුසුකම් (ඇත්නම්):————————.
8. වෘත්තීය සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවන්න):————————.
9. වෙනත් සුදුසුකම්:————————.

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු නොවන බව හා පත්වීම ලැබීමෙන් පසු එය ඔප්පු වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බව දන්වමි.

————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

07-27

# පළාත් පාලන නිවේදන

## කටාන ප්‍රාදේශීය සභාව

ගෝ ඝාතක ආඥා පනත (272 වන අධිකාරිය)

මෙහි පහත නම් සඳහන් වන අය එහි සඳහන් වන ස්ථානයේ 2011 වර්ෂයේ ගවමස්, එළුමස්, ඌරුමස් වෙළඳාම් කරගෙන යාම සඳහා බලපත්‍රය ලබා ගැනීමට ඉදිරිපත් වී සිටින බව ගෝඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරියේ 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍රය නිකුත් කිරීම පිළිබඳව කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කාරණයක් සඳහාද යනවග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට දින 21 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දැනුම් දෙමි.

පී. ලීලානන්ද සිල්වා,
සභාපති,
කටාන ප්‍රාදේශීය සභාව.

2011 ජූනි මස 03 වැනි දින,
කටාන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ස්ථානය* | *වෙළඳාම* |
|---|---|---|
| වින්ධ්‍යා සේනානි අමරසේකර, අංක 120/2, අරලිය මාවත, තිඹිරිස්කටුව. | අංක 440 බී, ගිරිඋල්ල පාර, කඳවල (කුළුණ අසල) | හරක්මස්/ඌරුමස් |

07-73

---

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (4) වන වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වන වගන්තිය යටතේ මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති හාලිඇල ජයතිලක මාවත උතුරු කොටස මාර්ගය හාලිඇල ප්‍රාදේශීය සභාව සතු මාර්ගයන් වශයෙක් 2011.04.01 වන දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද මුත්, එකී උපලේඛනයේ නම් සඳහන් ඉඩම් හිමියන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වගන්තිය ප්‍රකාරව කටයුතු නොකල හෙයින් පහත උපලේඛනයේ දක්වන හාලිඇල ජයතිලක මාවත උතුරු කොටස මාර්ගය හාලිඇල ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

සභාපති,
ප්‍රාදේශීය සභාව,
හාලි ඇල.

2011 ජූනි මස 11 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

| *පාරේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම්පස* | *දිග අඩි* | *දකුණු පස* | *දිග අඩි* | *පළල අඩි* |
|---|---|---|---|---|---|---|---|
| හාලිඇල ජයතිලක මාවත උතුරු කොටස | හාලිඇල ජයතිලක මාවත අන්තුඩුවාවෙල දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ ආර්. එම්. තුෂාර ප්‍රියන්ත හා අජන්තා ආරියරත්නගේ ඉඩම් අතරින් | ආර්. එස්. කේ සමරසිංහ මියගේ ඉඩම දක්වා | අජන්තා ආරියරත්න | 63 | ආර්. එම්. තුෂාර ප්‍රියන්ත | 116 | 10 |
| | | | ආර්. එම්. ගුණසේකර | 24 | | | 10 |
| | | | ආර්. එම්. පුංචිබණ්ඩා | 24 | ආර්. එම්. වික්‍රමසිරි | 66 | 10 |
| | | | ආර්. එම්. අමරසේකර | 90 | ජී. එම්. වනසිංහ | 27 | 10 |
| | | | ඩබ්. එම්. ධර්මදාස | 74 | ඩබ්. එම්. ජයතිලක | 82 | 10 |
| | | | ආරියලතාද සිල්වා | 22 | ඩබ්. එම්. ධනපාල | 290 | 10 |
| | | | අනුෂා වනසිංහ | 85 | | | 10 |
| | | | අයේෂා වනසිංහ | 60 | | | 10 |
| | | | කාංචනා බුද්ධිකා වනසිංහ | 60 | | | 10 |

07-81

**වීථි නම් කිරීමේ නිවේදනය**

බළපිටිය ප්‍රාදේශීය සභා බල සීමාව තුළ පිහිටි පහත උපලේඛනයේ නම් සඳහන් මාර්ග මහා ගොඩනැගිලි උපලේඛනයේ යෝජිත නම් යටතේ නම් කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මත කරන ලදුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය ප්‍රකාරව පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව පහත මාර්ග මින් ඉදිරියට යෝජිත නම්වලින් හැඳින්වීමට කටයුතු කරන බැව් නිවේදනය කරමි.

**උපලේඛනය**

| | *මාර්ගය* | *යෝජිත නාමය* |
|---|---|---|
| 01. | ගාළු කොළඹ මාර්ගයේ වැල්ලබඩින් ආරම්භ වන්නා වූ මංකඩ මාර්ගය | ඒ. දයාරත්න ද සිල්වා |
| 02. | ඇල්පිටිය අම්බලන්ගොඩ මාර්ගයේ වතුගෙදර මාර්කට් එක අසලින් ආරම්භ වන්නා වූ කුඩුවේගොඩ මාර්ගය | එම්. ඩබ්. සුනිල් විජේරත්න |
| 03. | අහුන්ගල්ල ඌරගහ මාර්ගයේ අහුංගල්ල පොළ අසලින් ආරම්භ වන්නාවූ මාර්ගය | ද සිල්වා මාවත<br>එම්. ජී. ද සිල්වා මාවත |
| 04. | බළපිටිය වඳදූව පන්සල් මාවත නමින් හඳුන්වන දේවාල පාර | එච්. ලීලසේන ද සොයිසා සිරිවර්ධන මාවත |
| 05. | බළපිටිය ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන වතුගෙදර පෙර පාසල | එම්. ඩබ්. සුනිල් විජේරත්න ද සිල්වා පෙර පාසල |

2011 ජූනි මස 08 වැනි දින,
බළපිටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

ඒ. දයාරත්න ද සිල්වා,
සභාපති,
බළපිටිය ප්‍රාදේශීය සභාව.

07-02

---

**කලවාන ප්‍රාදේශීය සභාව**

2011 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

කලවාන ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ දෙසැම්බර් මස 30 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ දැක්වෙන යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා පනවන ලද එම වරිපනම් එම කාර්තුව තුළ සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවද, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2011 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ලැබුණහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් (10%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

කේ. විජිත කරුණාරත්න,
සභාපති.

කලවාන,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය,

07-49/1

---

# අතුරු ව්‍යවස්ථා

**1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව උඩුබද්දාව ප්‍රාදේශීය සභාව විසින් 2010.09.28 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. රාජ්. සිසිර කුමාර,
සභාපති,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව.

2011 ජූනි මස 10 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*යෝජනාව*

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලදුව 2010.07.16 වැනි දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv(අ) කොටසේ පළකරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ ද ප්‍රාදේශීය සභාවල සම්මත අතුරු ව්‍යවස්ථාවල,

I. අංක 07-524/1 යටතේ අප්‍රසන්න, අන්තරාදායක හා අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,
II. අංක 07-524/2 යටතේ සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව,
III. අංක 07-524/3 යටතේ ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව,
IV. අංක 07-524/4 යටතේ ප්‍රාදේශීය සභා සීමාව තුළ මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව,
V. අංක 07-524/5 යටතේ ප්‍රාදේශීය සභා සීමාව තුළ පාරවල් සහ මංමාවත් සැරසිලි කිරීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව,
VI. අංක 07-524/6 යටතේ ලැගුම් නිවාස හා නවාතැන් පලවල් පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව.

යන අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ උඩුබද්දාව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

07-80

---

# විවිධ දැන්වීම්

## කලවාන ප්‍රාදේශීය සභාව

*වෙළඳ දැන්වීම් සඳහා බැනර්, කටවුට්, පුවරු සවි කිරීම*

*බැනර්*

| | *කාලය* | *බල ප්‍රදේශයේ ව්‍යාපාරික දැන්වීම් සඳහා රු. ශත* | *බල ප්‍රදේශයෙන් පිටත ව්‍යාපාරික දැන්වීම් සඳහා රු. ශත* |
|---|---|---|---|
| (1) | (අ) මාස එකක් හෝ එකට අඩු කාලයක් සඳහා වර්ග අඩියකට | 25 0 | 50 0 |
| | (ආ) මාස එකේ සිට මාස තුනක් දක්වා වර්ග අඩියකට | 35 0 | 70 0 |
| | (ඇ) මාස තුනකට වැඩි කාලයක් සඳහා වර්ග අඩියකට | 50 0 | 100 0 |

*වෙළඳ දැන්වීම් සඳහා බැනර් කටවුට් පුවරු සවි කිරීම*
*කටවුට්*

| | *කාලය* | *බල ප්‍රදේශයේ ව්‍යාපාරික දැන්වීම් සඳහා රු ශත* | *බල ප්‍රදේශයෙන් පිටත ව්‍යාපාරික දැන්වීම් සඳහා රු. ශත* |
|---|---|---|---|
| (1) | (අ) මාස එකක් හෝ එකට අඩු කාලයක් සඳහා වර්ග අඩියකට | 35 0 | 70 0 |
| | (ආ) මාස එකේ සිට මාස තුනක් දක්වා වර්ග අඩියකට | 40 0 | 80 0 |
| | (ඇ) මාස තුනට වැඩි කාලයක් සඳහා වර්ග අඩියකට | 50 0 | 100 0 |

*ප්‍රචාරක දැන්වීම් පුවරු*

| *කාලය* | *බල ප්‍රදේශයේ ව්‍යාපාරික දැන්වීම් සඳහා රු. ශත* | *බල ප්‍රදේශයෙන් පිටත ව්‍යාපාරික දැන්වීම් සඳහා රු. ශත* |
|---|---|---|
| ඕනෑම කාල වකවානුවක් සඳහා වර්ග අඩියකට | 100 0 | 200 0 |

*සැළකිය යුතුයි .-* ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කළ යම් හෝටලයක් හෝ නවාතැන්පළක් සම්බන්ධයෙන් පෙරාතුව වූ වර්ෂය සඳහා එම හෝටලයේ භෝජනාගාරයේ හෝ නවාතැන්පළේ ලැබීම්වල ප්‍රතිශතයක් වශයෙන් එම ලැබීම්වලින් 1% ක බලපත්‍ර ගාස්තුවක් අයකරනු ඇත. ව්‍යාපාරය මෙම වර්ෂයේ දී ආරම්භ කරන ලද්දේ නම්, මුල් මාස තුනේ ආදායම අනුව වාර්ෂික ආදායම දළ වශයෙන් තක්සේරු කර ඒ අනුව බලපත්‍ර ගාස්තු අය කරනු ලැබේ.

කේ. විජිත කරුණාරත්න,
සභාපති,
කලවාන ප්‍රාදේශීය සභාව,
කලවාන.

2011 ජනවාරි මස 06 වැනි දින,
කලවාන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

07-49/6

**කලවාන ප්‍රාදේශීය සභාව**

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථාව යටතේ 2011 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

කලවාන ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ දෙසැම්බර් 30 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 15 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ කලවාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2011 වර්ෂයේදී කලවාන ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගාස්තුවක් අය කරනු ලබන බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
කලවාන ප්‍රාදේශීය සභාව,
කලවාන.

2011 ජනවාරි මස 06 වැනි දින,
කලවාන ප්‍රාදේශීය සභාව.
කලවාන.

**යෝජනාව**

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාව යටතේ හෝ කලවාන ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ කලවාන ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වගන්තියේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලපත්‍ර ප්‍රකාර පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්ත වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමට කලවාන ප්‍රාදේශීය සභාව යෝජනා කරන ලදී.

*උපලේඛනය*

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *කර්මාන්තයේ ස්වභාවය* | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාව* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | බේකරි | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | මාළු වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | මස් වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | අයිස් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | සිසිල් බීම නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | ලොන්ඩ්‍රි | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | ගවගාල් | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | කොණ්ඩා කැපීම් හා සැකසුම් | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | භෝජනාගාර හෝ හෝටල් | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | තේ,කෝපි හෝ සිසිල් බීම වෙළඳ සැල් | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ආපනශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ග්‍රොසරි | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | සංචාරක නිකේතන | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ලැගුම්හල් | 500 0 | 750 0 | 1,000 0 |

07-49/5

---

**කලවාන ප්‍රාදේශීය සභාව**

2011 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

කලවාන ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ දෙසැම්බර් මස 30 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. විජිත කරුණාරත්න,
සභාපති,
කලවාන ප්‍රාදේශීය සභාව,
කලවාන.

2011 අප්‍රේල් මස 05 වැනි දින,
කලවාන ප්‍රාදේශීය සභාව,
කලවාන.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 160 වැනි වගන්තිය (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල අනුව කලවාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උප ලේඛනයේ II වැනි තීරුවේ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූපිත තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2011 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත් එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2011 මාර්තු මස 31 වැනි දිනට පෙර කලවාන ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට කලවාන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නේ ය.

*උපලේඛනය*

| *අනු. අංකය* | *I වැනි තීරුව කර්මාන්තයේ ස්වභාවය* | *II තීරුව* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශ.* | *රු. ශත* | *රු. ශත* |
| 01. | රෙදිපිළි අලවිය හා නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | ස්වර්ණාභරණ නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | ඇළුමිණියම් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය | | | |
| 04. | එළවළු, පළතුරු අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | ධාන්‍ය අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | මැටි භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | ලොතරැයි නියෝජිත ආයතන | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | ඉංග්‍රීසි බෙහෙත් ද්‍රව්‍ය වෙළඳසැල් (ෆාමසි) | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | සිංහල බෙහෙත් ද්‍රව්‍ය වෙළඳසැල් | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | සිල්ලර බඩු වෙළඳසැල් | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | දර මඩු | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | රස කැවිලි නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ගෘහ භාණ්ඩ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | විදුලි උපකරණ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ලිපිද්‍රව්‍ය වෙළඳසැල් | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | විසිතුරු මසුන් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | සත්ත්ව ආහාර අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | යෝගට් නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | මල් වෙළඳසැල් | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | ඇස් කණ්නාඩි අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | වඩු කර්මාන්ත ලියවන පට්ටල් | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | මැණික් කපා ඔපදමා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | කෘෂි භාණ්ඩ අලෙවිසැල් | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | පාවහන් නිෂ්පාදන | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | දැව අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | බුලත්, පුවක්, හුණු, දුම්කොළ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | වේවැල් භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | හම් භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | උළු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | ගිනි පෙට්ටි නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |

07-49/4

## කලවාන ප්‍රාදේශීය සභාව

2011 වර්ෂය සඳහා අක්කර බද්ද පැනවීම

කලවාන ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ දෙසැම්බර් මස 30 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහ ජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2011 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක්ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද එකී වර්ෂයේ මාර්තු මස 31 වැනි දින, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දින වලින් අවසන් වන එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

කේ. විජිත කරුණාරත්න,<br>
සභාපති,<br>
කලවාන ප්‍රාදේශීය සභාව,<br>
කලවාන.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ 6 වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කලවාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූද, ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද,

හෙක්ටයාර් 05කට අඩු නමුත් හෙක්ටයාර් 01කට වැඩි වන අවස්ථාවක රු. 50 ක්ද, හෙක්ටයාර් 05කට හෝ ඊට වැඩි අවස්ථාවක රු. 10 බැගින්ද, වාර්ෂිකව අය කිරීම.

ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (06) වැනි උප වගන්තියේ විධි විධාන යටතේ එකී වර්ෂයේ මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් 30 යන දිනවලට පෙර සමාන වාරික 04කින් ගෙවීමටත් විධාන කළ යුතු යැයි කලවාන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නේ ය.

07-49/2

---

## කලවාන ප්‍රාදේශීය සභාව

2011 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

කලවාන ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ දෙසැම්බර් මස 30 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහ ජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. විජිත කරුණාරත්න,<br>
සභාපති,<br>
කලවාන ප්‍රාදේශීය සභාව,<br>
කලවාන.

2011 අප්‍රේල් මස 05 වැනි දින,<br>
කලවාන ප්‍රාදේශීය සභාව,<br>
කලවාන.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පළමුවැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථා විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් කලවාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2011 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුටම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙකී පහත උපලේඛනයේ පළමුවැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්වන අවස්ථාවක එහි දෙවැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ බද්දක් 2011 වර්ෂයේ මාර්තු මස 03 වැනි දිනට පෙර කලවාන ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට කලවාන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නේ ය.

### උපලේඛනය

| | *I වැනි තීරුව* <br> *වර්ෂයේ වාර්ෂික ලැබීම්* | *II වැනි තීරුව* <br> *ගෙවිය යුතු බද්ද රු. ශත* |
|---|---|---|
| 01. | රු. 01 සිට රු. 6,000 දක්වා | නැත |
| 02. | රු. 6,001 සිට රු. 12,000 දක්වා | 90 0 |
| 03. | රු. 12,001 සිට රු. 18,750 දක්වා | 180 0 |
| 04. | රු. 18,751 සිට රු. 75,000 දක්වා | 500 0 |
| 05. | රු. 75,001 සිට රු. 1,50,000 දක්වා | 1200 0 |
| 06. | රු. 1,50,000 ට වැඩි වන විට | 5000 0 |

07-49/3

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිළ** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2011** | | | |
| ජූලි | 2011.07.01 | සිකුරාදා | 2011.06.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.07.08 | සිකුරාදා | 2011.06.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.07.15 | සිකුරාදා | 2011.07.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.07.22 | සිකුරාදා | 2011.07.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.07.29 | සිකුරාදා | 2011.07.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2011.08.05 | සිකුරාදා | 2011.07.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.08.12 | සිකුරාදා | 2011.07.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.08.19 | සිකුරාදා | 2011.08.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.08.26 | සිකුරාදා | 2011.08.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2011.09.02 | සිකුරාදා | 2011.08.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.09 | සිකුරාදා | 2011.08.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.16 | සිකුරාදා | 2011.09.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.23 | සිකුරාදා | 2011.09.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.30 | සිකුරාදා | 2011.09.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.